


ආදරණීය දුවේ පුතේ,

නවයේ අපේ නැටුම් පන්තියෙන් ශ්‍රී ලංකාවේ නර්තන කලාවේ ඓතිහාසික පසුබිම කියන මාතෘකාව යටතේ තමයි අද මම ඔයාලත් එක්ක කතා කරන්න හදන්නේ. අපි මේ ගැන 8 පන්තියේ දිත් කතා කරලා තියනවා රූකම් කියන පාඩමේ දී. මම හිතනවා ඔයාලට ඒ පාඩම මතක ඇති කියලා.

හොඳයි මට හිතුණා නර්තන කලාවේ ඓතිහාසික පසුබිම කියන්නේ මොකක්ද කියලා ඉස්සෙල්ලාම ආයෙමත් මතක් කර ගත්තොත් හොඳයි කියලා. ආ ඊටත් කලින් අපි පොඩ්ඩක් මතක් කර ගමු නර්තනය කියන වචනයේ ප්‍රභවය ගැන.




ආර්නෝල්ඩ් එල් හැස්කල්

දරුවනේ මම ඔයලාට කියලා තියෙනවා **නර්තනය කියන වචනය ඉස්සෙල්ලාම ප්‍රභවය වෙන්නේ ජර්මන් මූලයකින් බව**. ඇත්තටම මේ ගැන ඉස්සෙල්ලාම අදහසක් ප්‍රකාශ කරන්නේ මෙන්න මේ පින්තූරයේ ඉන්න කෙනා. එයාගේ නම තමයි දුවේ පුතේ **ආර්නෝල්ඩ් එල් හැස්කල්**. ඒ වචනයේ බටහිර අර්ථය තමයි දරුවනේ සියලු නර්තනයන් විදහා හැරීම කියන අර්ථය.

කොහොම වුනත් මතක තියා ගන්න ඕනි දේ තමයි දුවේ පුතේ **නර්තනය කියන්නේ සංවිධානාත්මක ( සංවිධිත ) ක්‍රියාවක් බව.** තවත් ඒ ගැන සරලව ම කියනවා නම් **නර්තනය කියන්නේ රිද්මයකට අනුකූලව කායික අඟපසඟ චලනය කිරීමෙන් සිදු කරන භාව ප්‍රකාශනයක්.** ඒ ගැන ඔයාලා දැනටමත් හුගක් දේවල් දන්නවා. ඒ කතාව ඇත්ත කියලා ඔය ඡයාරූප දැක්කාම ඔයාලට හිතා ගන්න පුළුවෙන් වෙයි. බලන්නකෝ රට රටවල් වල නර්තන සම්ප්‍රදායන්ගේ ඡයාරූප කිහිපයක්.






















ඒ ඡයාරූප බැලුවාම අපිට හොඳටම පැහැලදිලියි නේද දරුවනේ **නර්තනය කියන්නේ රිද්මයකට අනුකූලව කායික අඟපසඟ චලනය කිරීමෙන් සිදු කරන භාව ප්‍රකාශනයක් කියලා කියන ඇත්තක් කියලා.**

හොඳයි දරුවනේ දැන් දැන්ගන්න ඕනි නේද මේ නර්තන කලාවන් කොහොමද මේ ලෝකෙට ප්‍රභවය වුනේ කියලා. ඇත්තටම කොහොමද මේ නර්තනය ලොකේට බිහිවුණේ?

හොඳට මතක තියා ගන්න, **නර්තනයේ ප්‍රභවය මූලික සංකල්ප දෙකක් මත පදනම් වූ බව තමයි** සමාජ හා මානව විද්‍යාඥයන් ගේ පිළිගැනීම. ඒ **සංකල්ප දෙක තමයි පූජාර්ථය හා විනෝදාර්ථය** කියන සංකල්ප දෙක. ඒ කියන්නේ දරුවනේ අපේ ආදි මානවයා විසින් සිද්ධ කරපු පූජාර්ථමය ක්‍රියාවන් නිසාවෙන් හෝ විනෝදාර්ථ ක්‍රියාවන් නිසාවෙන් තමයි නර්තන කලාව ලෝකයට බිහිවුණාය කියලා විචාරකයන් කියන්නේ. ඔන්න බලන්නකෝ ආදි මනවයන්ගේ හා ඔවුන්ගේ ක්‍රියාකාරකම් කිහිපයක් අපි දැන් බලමුකෝ.











ඉතින් ඇත්තටම කිව්වොත් අපේ මානවයාගේ මුල් කාලයේ ඒ කියන්නේ ප්‍රාථමික අවධියේ දී දරුවනේ සීමිත චලන කිහිපයකට පමණක් සීමා වෙලා තිබුණ නර්තනය මිනිසාගේ දියුණුවත් එක්ක ඒ කියන්නේ මානව ශිෂ්ටාචාරයන්ගේ දියුණුවත් සමග අතිවිශිෂ්ට කලාංගයක් ලෙස මුළු ලොව පුරාම ව්‍යාප්ත වන්නට පටන් ගත්තා. ඔයගොල්ලෝ දන්නවානේ අපේ රටටත් ආවේණික වෙච්ච අති විශිෂ්ට නර්තන කලාවක් අපිට උරුම බව. අපි මේ ඉගෙන ගන්නේ අන්න ඒ අති විශිෂ්ට නර්තන කලාව ගැනනේ.

ඉතින් අද අපිට උරුම වෙලා තියෙන මේ අති විශිෂ්ට නර්තන කලාව කොයි කාලේ දි වගේ අපේ රටේ ප්‍රභවය වෙන්න ඇති කියලාද ඔයාලා හිතන්නේ? අන්න ඒ ගැන හොයලා බලන එකට තමයි දැන් අපි මේ **ශ්‍රී ලංකාවේ නර්තන කලාවේ ඓතිහාසික පසුබිම** කියන මාතෘකාවෙන් සාකච්චා කරගෙන යන්නේ.

ඉතින් අපි කොහොමද මේ අපේ රටේ ඒ අති විශිෂ්ට නර්තන කලාව ඒ කියන්නේ දේශිය නර්තන කලාව ආරම්භ වුණේ කොහොමද කියලා දැන ගන්නේ. **අපිට ඒක දැන ගන්න වෙන්නේ මගේ දරුවනේ මූලාශ්‍ර** වලින් විතරයි. මූලාශ්‍ර කියන්නේ මගේ දුවේ පුතේ අතීත මානවයා සිද්ධ කළේ දේ සොයා බලන්න තියන ක්‍රමවේදයට. මූලාශ්‍ර ප්‍රධාන වශයෙන් කොටස් දෙකක් තියෙනවා. **එකක් තමයි පුරා විද්‍යාත්මක මූලාශ්‍ර. අනෙක් එක තමයි ලිඛිත මූලාශ්‍ර.**

එහෙමනම් දරුවනේ අපි දැන් බලමු මොනවද පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර කියන්නේ කියලා. අතීත මානවයා විසින් අඳින ලද චිත්‍ර වගේ නිර්මාණය කරනු ලැබූ කැටයම්, මූර්ති, රූකම්, ගොඩනැගිලි, ස්මාරක, තව ලෙන් ලිපි, ඒ වගේම සෙල්ලිපි ආදිය තමයි පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර කියලා කියන්නේ. ඔයාලට පුරාවිද්‍යාමත්ක මූලාශ්‍ර මොනවද කියලා අදහසක් ගන්නත් එක්ක මම පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයන්වල රූප කිහිපයක් ඔයාලට පෙන්නනම් . ඔන්න බලා ගන්නකෝ එහෙනම්.







සැකසුම - ර/ නිවි කෙහෙල්ඔව්ටිගම විද්‍යාලයීය නර්තන විෂය භාර **D. M. D. A** අනුපමා ගුරුතුමිය

එහෙමනම් දැන් ඔයාලට අදහසක් ඇති පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර කියන්නේ මොනවද කියන එක ගැන. හොඳයි දරුවනේ අපි දැන් බලමු අපේ නර්තන කලාව කොයිතරම් අතීතයකට උරුම කම් කියනවද කියලා. ඔන්න ඉතින් දරුවනේ අපිට ඒ ගැන දැන ගන්න පුළුවන් හොඳම මූලාශ්‍රය පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයක් වෙච්ච **සෙල්ලිපි.** ඔව් දරුවනේ ඈත අතීතයේ දී නර්තන කලාවක් තිබුණාය කියල සඳහන් වන සෙල් ලිපියක් අප සතුව තියනෙවා. ඒ සෙල්ලිපිය



අයිති වෙන්නේ අනුරාධපුර රාජධානියට. ඒ කියන්නේ අපේ පලවෙනි රාජධානිය. දැන් ඔයාලා මේ දකින්නේ අතීත අනුරාධ පුර රාජධානියේ ඡයාරූපයක්.

එහෙනම් අනුරාධපුර යුගය තරම් ඈත අතීතයකට අයිති වන අපේ නර්තන කලාව ගැන සඳහන් වන එක සෙල්ලිපියක් තමයි දරුවනේ **සැස්සේරුව සෙල් ලිපිය.** දන්නවද ඒ සෙල්ලපිය නර්තන කලාව ගැන මොනවද සඳහන් වෙන්නේ කියලා. ක්‍රි වර්ෂ 1 හෝ 2 කාලේ නිර්මාණය වෙලා තියෙන මේ සෙල්ලිපියේ සඳහන් වෙනවා දරුවනේ **නටන ගහපතියා විසින් පවරා දෙන ලදී** කියලා. නටන ගහපතියා කියන වචනය මේ සෙල්ලිපියේ භාවිත කරලිම නිසාවෙන් විචාරකයෝ කියනවා නර්තනය ගැන දැන උගත් නැටුම් පරම්පරාවක් මේ අනුරාධපුර රාජධානියේ හිටියාය කියලා. ඒ ගැන සනාත කරන තවත් සෙල්ලිපියක් තියෙනවා දරුවනේ ඒ තමයි **කොරවක්ගල් ලෙන සෙල්ලිපිය**.ඒ සෙල්ලිපියේ සඳහන් වෙනවා **නටන ගහපතියාගේ දුව විසින් පවරා දෙන ලදි** කියලා.මේ සෙල්ලිපි දෙකෙන්ම පැහැදිලි වෙනවා අනුරාධපුරය කියන අපේ පලවෙනි රාජධානි කාලයේම අපේ රටේ නර්තන කලාවක් පැවතුණා කියලා.

අපි ඒ කතා කලේ අනුරාධපුරය යුගය ගැනනේ. ඔන්න බලන්නකෝ



පොළොන්නරු යුගයෙත් අපේ නර්තන කලාව තිබුණාය කියලා පුරා විද්‍යාත්මක සාක්ෂි තියෙනවා.

දැන් ඔයාලා ඔය දකින්නෙ අතීත පොළොන්නරු යුගයට අයත් වෙච්ච වටදාගෙයක්.



ඔන්න දරුවනේ පොළොන්නරු යුගයට අයත් වෙන **පාලමොට්ටයි** කියන සෙල්ලිපියෙනුත් අපේ නර්තන කලාව ගැන හුඟක් තොරතුරු දැන ගන්න පුළුවන් කමත් තියෙනවා. **මේ රටේ දේවදාසින් සිටි බවත් ඔවුන් නැටූ බවත් ලංකාව සොළීන්ට යටත් වූ පසුව මෙවැනි ආකාරයට දෙවියන් උදෙසා පූජා නැටුම් පැවැත්වීම ආරම්භ වූ බවත් මේ සෙල්ලිපියෙන් කියෙවෙනවා.**

අනික දරුවනේ මෙම සෙල් ලිපියට අනුව **නළලෙහි සලකුණු තබා දේවදාසීන් හත්දෙනකු පිදූ බවත් ඔවුන්ට තැන්පත් කළ මුදලක පොළියෙන් කාසි ගෙවූ බවත් කියවෙනවා.**


මේ සෙල්ලිපියෙනුත් ඔප්පු වෙන්නේ පොලොන්නරු යුගය වන විටත් නර්තන කලාව අපේ රටේ ව්‍යාප්තව පැවතිච්ච බව.

ආ තව පොඩ්ඩෙන් අමතක වෙනවා දරුවනේ කාලිංග වනෝද්‍යානයේ ගල් ආසන ලිපියත් නර්තන කලාව ගැන සඳහන් වෙන තවත් වැදගත් සෙල් ලිපියක්.


මේ සෙල්ලිපියේ සඳහන් වෙනවා කාලිංග වනයෙහි නෘත්‍ය ගීත බලා වැඩ හිඳිනා සිංහාසනය යි, කියලා. ඉතින් ඒ කියන්නේ මේ කාලයෙත් නර්තනය තිබුණා කියලා නිකම්ම ඔප්පු වෙනවා.

හොඳයි දැන් අපිට පුරා විද්‍යාත්මක සාධක වලින් විතරද මේ රටේ නර්තන කලාව තිබුණාය කියලා ඔප්පු කරන්න පුළුවන්. නෑ දරුවනේ පුරාවිද්‍යාත්මක සාධාක විතරක් නෙවෙයි අපේ රටේ නර්තන කලාවක් තිබුණාය කියලා තොරතුරු දැන ගන්න ලිඛිත මුලාශ්‍රවලිනුත් පුළුවන්.

ලිඛිත මුලාශ්‍ර කියන්නේ දරුවනේ අතීත මිනිසා විසින් ලියා තැබූ පොත් පත් ලේඛන වගේ දේවල්. අපේ පැරණිම ලිඛිත මුලාශ්‍රයන් තමයි මහා වංශය, දළදා සිරිත, ථූප වංශය, වැනි කෘතින් අපිට තිබෙන ලිඛිත මුලාශ්‍රයන් ලෙසින් හඳුන්වා දෙන්න පුළුවන්.










ඉතින් නර්තන කලාව ගැන සඳහන් වන ලිඛිත මූලාශ්‍ර අතර අපි දැන් කතා කරන්නේ මොනව ගැනද කියලා ද ඔයාලා හිතන්නේ. උත්තරය හරිම ලේසියි. උත්තරය තමයි සංදේශ කාව්‍ය ය. ඔව් දරුවනේ තිසර සංදේශය, හංස සංදේශය, සැලලිහිණි සංදේශය කියන සංදේශ කාව්‍යයන් වල නර්තනය ගැන බොහෝ දේවල් සදහන් වෙනවා.

අපි එහම නම් ඉස්සෙල්ලාම බලමු කොහොමද තිසර සංදේශයේ මේ අපේ නර්තන කලාව ගැන සඳහන් වෙන්නේ කියලා.

තහළම් තළ බෙර තම්මැට පට තත්තිරි ඩමුරු
තඹමේ ඩැක බෙර බොම්බිලි වීණා මිණි සුසිරු
බෙර මද්දළ කහළම් රසු නිගළම් බඳ සොදුරු
ඤමසියල් මහ ගිගුමෙන් පළ කෙරමින් සිදු අයුරු

නියෙනඟ හරතැදුරන් කී ලෙසටා
බැස රඟ තම නතු පදයෙහි පිහිටා
නුවනඟ බැලුමෙන් ලා සුබ දිගටා
පඬෙරඟ රඟ සිරි පෑ වැනි එවිටා

නිලුපුල් දිගැසී තන රන කලසී
විදුලිය සදිසි සියුමැලි දිගැසි
රඟ බැස නොලසී රඟ දෙන විලසී
දුටු එම විගසී මද තෙම ඇවිසී





මෙම කාව්‍යයන්ගෙන් එම කාලයේ භාවිත කළ වාද්‍ය භාණ්ඩ හා නර්තන අංග පිළිබඳවත් එකල නැටුමට භාරතීය ආභාසය ලැබුණු අනදමත් වඩාත් හොඳින් සඳහන් වෙනවා දුවේ පුතේ. එම නිසා මේ කාව්‍යය තුළින් අපට සනාථ වෙන්නේ මේ 14 වන සියවසේ නැතිනම් ගම්පොළ රාජධානි කාලය වන විට නර්තන කලාව කොහොම ද තිබ්බෙ කියන එක ගැන.



හොඳයි දැන් අපි බලමුකෝ කෝට්ටේ යුගයේ දි රචනා කළ සැලලිහිණි සන්දේශ කාව්‍ය ගැන. මේ තියෙන්නේ සැලලිහිණි සන්දේශ කාව්‍ය යේ තියන කාව්‍ය කිහිපයක්.

**සැළලිහිණි සන්දේශය**





විදෙන ලෙලෙන නරු බර පුළුලුකුල රැඳී
හෙළන නගන අත නුවනග බැලුම් දිදී
රුවන දිලෙන අබරණ කැලුම ගත යෙදී
සැලෙන පහන සිළු වැනි රඟන ලිය සැදී

ලකල පුළුලුකුල බැඳි මිණි මෙවුල්ලා
සමඟ රන් සළඹ රැවු දී වෙවුල්ලා
වයන පදට තබමින් පද කමල්ලා
රඟන ළඳුන් බල රූ සිරි සියල්ලා

මෙම කාව්‍යන්ගෙන් එකල කාන්තාවන් දක්ෂ ලෙස නර්තනයේ යෙදුණු අන්දම පිළිබඳව තමයි පැහැදිලි වෙන්නේ.ඒ නිසාම මගේ දරුවනේ කෝට්ටේ යුගයේදී ත් නර්තන කලාව දක්නට තිබූ බව අපිට කියන්න පුළුවන්.

ඊට පස්සේ අපේ නර්තන කලාව ගැන සඳහන් වෙන සංදේශ කාව්‍ය ය අපි දැන් බලමු දරුවනේ. කොහොමද පරවි සංදේශයේ මේ අපේ නර්තන කලාව ගැන සඳහන් වෙන්නේ කියලා.




ලෙළඳුන් නව තඹ පලු වන් පාදේ
තබමින් නිවරද මද්දල නාදේ
ගයමින් පානා ගීයෙන් කීදේ
අඟනන් රඟ දුටුවන් සිතු පෑදේ

කෙළ වන දිගු නෙත නිලුපුල සේයා
ලෙළ පවනින් රන් ලිය විලසේයා
නළඟන රඟනා දැක නොලසේයා
නළඟන නුවනත රඟ සැලසේයා

දුවේ පුතේ මේ කාව්‍යයන්ගෙනුත් එකල කාන්තාවන් නර්තනයේ යෙදුණු සුන්දර ආකාරය පිළිබඳව තමයි කියවෙන්නේ.



**ඔන්න මගේ දුවේ පුතේ අපි දැන් ශ්‍රී ලංකාවේ නර්තන කලාවේ ඓතිහාසික පසුබිම ගැන සෙල්ලිපි සහ සන්දේශ කාව්‍ය කියන මූලාශ්‍ර දෙක ඔස්සේ කරුණු බොහොමයක් දැනගත්තා.** දැන් ඉතින් අපේ වෙලාව ඉවරයි. දැන් ඔයාලාට පුළුවන් ආයේ ආයේ මේ පාඩම හොඳින් කියවලා බලලා මේ පහළ මම අහලා තියෙන ප්‍රශ්න වලට උත්තර ලියන්න. එහෙමනම් දරුවනේ ඔයාලා හැමෝටම ආයුබෝවන්. පරිස්සමින් ඉන්න ඉක්මනටම ඊළඟ පන්ති දවසේදී මුණ ගැහෙමු.

## දැන් අපි මේ ප්‍රශ්න වලට උත්තර ලියමු

**01. දේශීය නර්තන කලාව පිළිබඳ ඓතිහාසික සාධක ගවේෂණයේ දී හඳුනා ගත හැකි මූලාශ්‍රයන් මොනවාද ?**

**02. නර්තන කලාව පිළිබඳ තොරතුරු ලබා ගත හැකි සෙල්ලිපි තුනක් නම් කරන්න.**

**03. කොරවක් ගල ලෙන් ලිපියේ සඳහන් වන්නේ කුමක් ද?**

**04. නර්තන කලාව පිළිබඳ තොරතුරු සපයා ගත හැකි සංදේශ කාව්‍ය 03 ක් නම් කර ඉන් තිසර සංදේශයේ ඇතුලත් කවියක් ලියන්න.**

